# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1819/8 - 2013 ජූලි මස 16 වැනි අඟහරුවාදා - 2013.07.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 104/44.

භාර ආඥාපනත (87 වැනි අධිකාරය වූ)

114 වැනි වගන්තිය යටතේ නියමය

"රිඩෙම්ටෝරිස් ෆාදර්ස් " යන භාරයේ භාරකරුවන් වන -

1. ගරු ෆැන්සිස් නීල් ඩයස් කරුණාරත්න පියතුමා,
2. ගරු අඹගහගේ සනත් කුමාර ප්‍රනාන්දු පියතුමා,
3. ගරු ගම්පොලවඩුගේ ඇන්ටන් ශිරාන් ෆොන්සේකා පියතුමා,
4. ගරු වර්ණකුලසූරිය රුෆුස් ඉවාන් ප්‍රනාන්දු පියතුමා,
5. ගරු පැට්රික් ජෝෂප් එමානුවෙල් පෙරේරා සොහොයුරා,
6. ගරු පිලිප් බෙන්ටියුස් ඇන්තනි මලවිආරච්චි පියතුමා,
7. ගරු ශාන්ත ජෙරාඩ් රැක්ස්ටන් අබේසිංහ පියතුමා,
8. ගරු ඩෙස්මන්ඩ් විමල් ඇන්තනි තිරිමාන්න පියතුමා,
9. ගරු අමරසිංහ ආරච්චිගේ ක්‍රිස්ටෝපර් රොහාන් පෙරේරා පියතුමා,
10. ගරු පොඩිපිලි ආරච්චිගේ චන්දන සංජීව කුමාර පෙරේරා පියතුමා,

යන අය එකී භාරයේ භාරකරුවන් වන හෙයින්, ඔවුන් විසින් භාර ආඥාපනතේ (87 වැනි අධිකාරය වූ) 114 වැනි වගන්තිය යටතේ එකී භාරය සංස්ථාගත කිරීම සඳහා අධිකරණ අමාත්‍යවරයා වෙත ඉල්ලුම් කර ඇති හෙයින් ද,

එකී භාර ආඥාපනත මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, අධිකරණ අමාත්‍ය රාවුෆ් හකීම් වන මා විසින් ඉහත කී භාරය සංස්ථාගත කිරීම සඳහා මෙම නියමය මගින් විධාන කරනු ලබන අතර -

(අ) ඉහත නම් සඳහන් භාරයේ භාරකරුවන් සහ ඉහත කී භාරයේ රීති යටතේ තත් කාලය සඳහා යථා පරිදි පත් කරන ලද ඔවුන්ගේ අනුප්‍රාප්තිකයන් සහ මහනුවර/මාතලේ ප්‍රසිද්ධ නොතාරිස් සේගු පරීඩ් මොහොමඩ් සවහීර් විසින් සහතික

1A - G 17968— 360 (2013/07)
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කරන ලද 2011 ඔක්තෝබර් මස 28 වැනි දින අංක 2489 දරන භාරය ප්‍රකාශයට පත් කිරීම "රිඩෙම්ටෝරිස් ෆාදර්ස් " යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු බවටත් ;

(ආ) ඉහත කී භාරකරුවන් විසින් ඉහත කී භාරය වෙනුවෙන් එකී නාමය සහ විලාශය යටතේ යම් නිශ්චල හෝ චංචල දේපළක් මිලදී ගැනීම, ලබා ගැනීම, දැරීම, බද්දට ගැනීම හෝ අන්‍යාකාරයකින් අත්කර ගැනීම, විකිණීම, හුවමාරු කිරීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, බදු දීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම සිදු කළ හැකි බවටත් ; සහ

(ඇ) ඉහත කී භාරයට අදාළව පැන නගින යම් නඩු නිමිති සහ නඩුවල දී ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත යම් අධිකරණයක දී භාරකරුවන් විසින් ඉහත කී නාමයෙන් සහ විලාශයෙන් නඩු පැවරීම සහ නඩු පවරනු ලැබීමට පිළිතුරු දීමට සහ පිළිතුරු ලබා ගැනීමට, විත්තිවාචක ඉදිරිපත් කිරීමට සහ විත්තිවාචක ලබා ගැනීමට හැකි විය යුතු බවටත්, බලය ඇති බවටත්,

විධාන කොට ප්‍රකාශයට පත් කරමි.

මෙම නියමය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම හෝ අවශ්‍ය යැයි මට පෙනී යන පරිදි කලින් කල වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම කරනු ලැබිය හැකි ය.

රාවුෆ් හකීම්,
අධිකරණ අමාත්‍ය.

2013 ජූලි මස 15 වැනි දින,
කොළඹ දී ය.

08-81

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.